**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (භූගෝල විද්‍යාව) - තෙවන භාගය**

**ප්‍රථම සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2018**

# GYG 4194 - උසස් කාර්මික භූගෝල විද්‍යාව

**පැ දෙකයි (02)**

ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න.

---

1.

(i). කර්මාන්ත ස්ථානගත වීම පිළිබඳ මූලධර්ම කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ii). කිසියම් කර්මාන්තයක ස්වභාවය අනුව කර්මාන්ත ස්ථානගත වීම පිළිබඳ මූලධර්මවල විචලනයන් නිශ්චිත උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

2. " පසුකාලීන විද්‍යාර්ථීන් විසින් ඇල්ෆ්‍රඩ් වෙබර් (Alfred Weber) කර්මාන්ත ස්ථානගතවීම පිළිබඳ ඉදිරිපත් කළ සංකල්ප විවේචනයට ලක් කළ ද වර්තමාන කර්මාන්ත ස්ථානගත වීම සම්බන්ධයෙන් ද ඔහුගේ අදහස් ගැලපිය හැකිය." මෙම කියමන විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 20)

3.

කිසියම් ප්‍රදේශයක කර්මාන්තයක් සඳහා වඩාත් සුදුසු පිහිටීම තීරණය කිරීමෙහි ලා පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයෙහි (Cost-Benefit Analysis) වැදගත්කම උචිත නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4.

i. ගෝලීයකරණ ක්‍රියාවලියෙහි ප්‍රධාන ලක්ෂණ සඳහන් කරන්න.

(ලකුණු 05)

ii. 1960න් පසු නව අන්තර් ජාතික ශ්‍රම විභජනය (New International Division of Labour) මගින් කර්මාන්ත කටයුතු ලොව පුරා වර්ධනය වී ඇත්තේ කෙසේදැයි විග්‍රහ කරන්න.

(ලකුණු 15)

5.

(i). ප්‍රාදේශීය සංවර්ධනයේ දී කර්මාන්තවල කාර්ය භාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ii). " ගුණන ප්‍රතිඵල (Multiplier effect) යාන්ත්‍රණය තුළින් ප්‍රාදේශීය සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කරගත හැකිය." මෙම කියමන උචිත නිදසුන් සහිතව විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 15)

6. තිරසාර කාර්මීකරණ ක්‍රියාවලියක් සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය විසින් අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

0000000000